ප්‍රති ප්‍රබෝධා - 2024

5 ශ්‍රේණිය

5 ශ්‍රේණියේ සියලු දරුවන් සඳහා පැවැත්වෙන

පෙරහුරු පරීක්ෂණය

(I පත්‍රය) **කාලය පැය 1 යි**

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය :-.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉර මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරු යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේතය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH

-උතුරු මැද පළාත් ප්‍රාථමික අංශය -

1) පහත දී ඇති රූපය ඇසුරෙන්, නිවැරදි ම වගන්තිය තෝරන්න.




i. කෙසෙල් ගස ඇත්තේ නිවසට ඉදිරි පසිනි.

ii. වැව් බැම්ම මත කරත්තය ගමන් කරයි.

iii. අහසේ කුරුල්ලෝ 4 දෙනෙක් පියාසර කරති.

2) පහත රටාවේ ඊළඟට ආයුතු රූපය වන්නේ,



(i) (ii) (iii)


.....

3) පෙරවරු 7.30 ආරම්භ කළ මීටර් 300 ධාවන තරගයක් ක්‍රීඩකයින් 4 දෙනෙක් අවසන් කළ වේලාවන් පහත දැක්වේ. ඒ අනුව මෙම තරඟයේ පළමු වැනියා වන්නේ,

සුරත් පෙ.ව. 7.42
චමත් පෙ.ව. 7.38
විමන් පෙ.ව. 7.40
කමල් පෙ.ව. 7.36

i. විමන් ii. සුරත් iii. කමල්

4) දී ඇති රූපය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.



i. ත්‍රිකෝණ 6 වෘත්ත 5
ii. ත්‍රිකෝණ 5 වෘත්ත 5
iii. ත්‍රිකෝණ 5 වෘත්ත 6

5) වෘත්ත දෙකක් එක මත එක තබා පහත අටවුම් සකස් කර ඇත. එහි වෘත්ත දෙක වෙන වෙන ම කරකැවිය හැක. සලකුණු කර ඇති ස්ථානයේ සිට විශාල වෘත්තය සම්පූර්ණ වටයක් ද කුඩා වෘත්තය වට බාගයක් ද ඊතලයෙන් පෙන්නුම් කර ඇති දිශාවට කරකැවූ විට දැකිය හැකි රූපය වන්නේ,



(i)



(ii)



(iii)



6) පැයක් තුළ පාරක ගමන් කළ වාහන පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- ගමන් කළ යතුරු පැදි ප්‍රමාණය, ගමන් කළ ලොරි රථ මෙන් දෙගුණයකි.
- ගමන් කළ කාර් හා බස් ප්‍රමාණය, යතුරු පැදි ප්‍රමාණයට වඩා 8 ක් වැඩිය.
- ගමන් කළ බස් රථ ප්‍රමාණය හා කාර් ප්‍රමාණය සමානය


ගමන් කළ බස් රථ ප්‍රමාණය 6 ක් නම් අඩුවෙන් ම ගමන් කළ වාහන වර්ගය වන්නේ,

i. බස් ii. ලොරි iii. යතුරු පැදි

7) එක්තරා මාසයක ආරම්භක දවස සඳුදා ය. එම මාසය අවසන් වන දවස සඳහා නොගැළපෙන දවස කුමක් ද?


i. ඉරිදා ii. අඟහරුවාදා iii. බ්‍රහස්පතින්දා

8) රූපයේ දක්නට ලැබෙන ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද?




i. 4
ii. 5
iii. 6

9) පහත රූපයේ කොටු වලට සංඛ්‍යා පුරවා ඇත්තේ යම් රටාවකට ය. කොටු සියල්ලම පිරවූ විට A කොටුවට එන සංඛ්‍යාව වන්නේ,




i. 176 ii. 178 iii. 196

10) රටාවේ හිස් තැනට ආයුතු සංඛ්‍යාව වන්නේ



i. 7 ii 14 iii. 10

11) පහත දී ඇති රූප - රටාවේ ඊළඟට ආ යුතු රූපය කුමක් ද?



12) වට්ටි තුනක මල් ඇත්තේ පහත පරිදි ය.

- රතු පාට මල් ඇති වට්ටියේ කහපාට මල් නැත. දම්පාට මල් ඇත.
- නිල් පාට මල් ඇති වට්ටියේ රතුපාට මල් ඇත. කහ පාට මල් නැත.
- රෝස පාට මල් ඇති වට්ටියේ කහ පාට මල් නැත.රතු පාට මල් ඇත.


ඒ අනුව වට්ටි තුනේ ම ඇති මල් වර්ගය වන්නේ,

i. රතුපාට මල් ii. දම්පාට මල් iii. කහපාට මල්

13)සමහර ගෙඩි එළවළු මෙන්ම පලතුරු ලෙස ද භාවිතා කරයි. නිමල් ළඟ ඇති ගෙඩිය එළවළුවක් මෙන් ම පලතුරක් ලෙස ද භාවිතා කළ හැකි ය. නිමල් ළඟ ඇති ගෙඩිය විය හැක්කේ

i. පිපිඤ්ඤා ii. අඹ iii. පුහුල්

14) පාසලක ගොඩනැගිලි පිහිටා ඇති සැලැස්මක් පහත දැක්වේ. ඒ අනුව පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




i. ගේට්ටුවේ සිට ඉදිරියට ගොස් වමට හැරි ඉදිරියට ගිය විට පුස්තකාලය හමුවේ

ii. අංක 03 ශාලාවේ සිට ඉදිරියට ගොස් වමට හැරී යන විට කාර්යාලය හමුවේ


iii. අංක 1 ශාලාවේ සිටින ළමයෙකු ගේට්ටුව ළඟට යාමට වමට දෙවරක් ද දකුණට එක් වරක් ද හැරිය යුතු වේ

15)ළමයෙක් A කොටුවෙන් ආරම්භ කර පිළිවෙළින් කොටුවක් හැර ඊළඟ කොටුව ද ඉන්පසු කොටු දෙකක් හැර ඊළඟ කොටුව ද යන ආකාරයට පිළිවෙළින් ඉදිරියට පනියි. ඒ අනුව මෙම ළමයා හත්වන වරට පනින කොටුවේ අංකය වන්නේ,



i. 15 ii. 16 iii. 18

16) සතුන්,සුරතල් සතුන්,වන සතුන් කොටියා බල්ලා සම්බන්ධතාවය දැක්වීමට ගැළපෙන සටහන කුමක් ද



(i) (ii) (iii)

17) සමන් කැටයකට මුදල් දැමූ ආකාරය පහත දැක්වේ. පළමු දිනයේ රුපියල් 5 කාසි ප්‍රමාණයක් ද එමෙන් දෙගුණයක් රුපියල් 10 කාසි ප්‍රමාණයක් ද දෙවන දිනයේ පළමු දිනයේ දැමූ මුළු කාසි ගණනට සමාන රුපියල් 5 කාසි ප්‍රමාණයක් ද එම ප්‍රමාණයෙන් බාගයක් රු 10 කාසි ද දමන ලදී. දමා ඇති මුළු රුපියල් 10 කාසි ගණන 21 නම් පළමු දිනයේ දී දැමූ මුළු කාසි ගණන කිය ද?

i. 18 ii. 20 iii. 36


18) ලොකු පෙට්ටියක් තුළ කුඩා පෙට්ටි 8 ක් ද ඒ සෑම කුඩා පෙට්ටියක් තුළ ම තවත් කුඩා පෙට්ටි දෙක බැගින් ද ඇත. සෑම කුඩා පෙට්ටියක් තුල ම විදුරු බෝල 4 බැගින් තිබේ නම් මුළු පෙට්ටියේ ම ඇති විදුරු බෝල සංඛ්‍යාව කිය ද?

i. 32 ii 48 iii. 64

19) බල්බ වැලක රතු පාට, කහ පාට,නිල් පාට බල්බ එක බැගින් පිළිවෙළින් අමුණා ඇත. පළමු බල්බය හා අවසාන බල්බය එකම වර්ණයකින් යුක්ත නම් පහත ප්‍රකාශ වලින් වැරදි ප්‍රකාශය කුමක් ද?

i. වැඩියෙන්ම ඇත්තේ රතුපාට බල්බ ය
ii. කහපාට හා නිල්පාට බල්බ ප්‍රමාණය සමාන ය
iii. නිල්පාට හා රතු පාට බල්බ ප්‍රමාණය සමානය

20)



ඉහත ඝනකය සෑදී ඇති කුඩා ඝනක සියල්ල වෙන්කර එම කුඩා ඝනක කිහිපයක් ඒක්කර සෑදිය හැකි කුඩා ම ඝනක සෑදුවේ නම් ඉතිරිවන ඝනක ප්‍රමාණය කීය ද?


i. 5 ii. 8 iii. 20

21) පහත කවියෙහි හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

සර සර ගා වැස්ස වහිනවා
..... වතුරින් මිදුල පිරෙනවා
වහල මතින් ..... බේරෙනවා
..... හඬත් දසත ඇහෙනවා


i. බොර , සුළඟ , අකුණු
ii. පිරිසිඳු , දිය , විදුලි
iii. බොර , දිය , අකුණු

22) A රූපයේ දැක්වෙන වෘත්තාකාර කඩදාසිය කඩඉරි දිගේ නවා ලැබෙන B රූපය එහි දැක්වෙන කඩඉරි දිගේ කපා වෙන්කළ විට ලැබෙන කැබලි ගණන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.




i. ප්‍රමාණයෙන් එකිනෙකට වෙනස් කැබලි තුනක් ලැබේ
ii. ප්‍රමාණයෙන් සමාන කැබලි හතරක් ලැබේ
iii. ප්‍රමාණයෙන් සමාන කැබලි තුනක් ලැබේ

23) ළමයි පෝලිමක ගැහැනු ළමයි සහ පිරිමි ළමයි සිටිති. පෝලිමේ දෙපස ඇති අංක 2 හි එකතුව 9 වන ස්ථානවල සිටින්නේ ගැහැනු ළමයෙකි. එකතුව 9 වූවත් ගැහැනු ළමයි දෙදෙනකු එක ළඟ සිටින්නේ ද නැත. පහත සටහනට අනුව පෝලිමේ සිටින ගැහැනු ළමයි ගණන කීයද?




i. හයකි ii. හතරකි iii. පහකි

24) රූපයෙහි දැක්වෙන ආකාරයට එකම මාර්ගයක ABCD නගර පිහිටා ඇත. AB දුරත් BC දුරත් සමාන වන අතර AC දුරත් CD දුරත් සමාන වේ. එකම වෙලාවක එකම වේගයකින් A නගරයේ සිට D නගරයටත් D නගරයේ සිට සිට A නගරයට යාමට මිනිසුන් දෙදෙනෙක් ගමන් ආරම්භ කරයි. ඔවුන් මුණ ගැසෙන අවස්ථාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




i. ඔවුන් මුන ගැසෙන්නේ C හා D නගර අතරය
ii. ඔවුන් මුණ ගැසෙන්නේ C නගරයේ දිය.
iii. ඔවුන් B හා C නගර අතර මුණ ගැසේ.

25) විරුද්ධ පැතිවල සමාන සලකුණු ඇති ඝනකයක රූපයක් පහත දැක්වේ. මෙම ඝණකය දී ඇති කොටු සහිත මාර්ගය දිගේ ඊතලවලින් පෙන්වා ඇති පරිදි පෙරළමින් ගෙනයයි. ? ඇති කොටුවේදි ඝනකයේ උඩු අතට ඇති මුහුණත පෙන්වන පිළිතුර තෝරන්න.



26) පහත දැක්වෙන මාර්ග සිතියමේ එකම මාර්ගයේ එක් වාරයකදී දෙවරක් නොයන පරිදි A සිට B දක්වා ළඟා විය හැකි මාර්ග කීයක් තිබේද ?



i. දෙකකි ii. තුනකි iii. හතරකි

27) 1 සිට 100 තෙක් සංඛ්‍යා ලියූ විට ලියවෙන 5 ඉලක්කම් සියල්ලේ ම එකතුව වන්නේ ,

i. 100 ii. 75 iii 50

28) A ඔරලෝසුවේ වේලාව නිවැරදි වේලාවට වඩා මිනිත්තු 5 ක් අඩුවෙන් පෙන්වයි. B ඔරලෝසුවේ වේලාව නිවැරදි වේලාවට වඩා මිනිත්තු 10 ක් වැඩියෙන් පෙන්වයි. B ඔරලෝසුවේ වේලාව 7.30 වන විට A ඔරලෝසුවේ වේලාව වන්නේ,

i. වේලාව 7.40 ii. වේලාව 7.15 iii. වේලාව 7.25

29) වෘත්තාකාර ධාවන මාර්ගයක එකම ස්ථානයෙන් එකම දිශාවට ක්‍රීඩකයින් දෙදෙනෙක් ධාවන ආරම්භ කරයි. A ක්‍රීඩකයා මෙන් දෙගුණයක් වේගයෙන් B ක්‍රීඩකයා දුවයි. A ක්‍රීඩකයා රවුම් $2\frac{1}{2}$ ක් දුවන විට B ක්‍රීඩකයා A ක්‍රීඩකයා පසුකර යන වර ගණන වන්නේ,

i. වාර තුනකි ii. වාර එකකි iii. වාර දෙකකි

30) රමණිට වඩා සචිනි වයසය. රුවිනි සචිනිට වඩා වයස නමුත් ඉෂිනි වඩා බාලය. මේ අනුව වැඩිමහල් හා බාලම අය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. ඉෂිනි රමණි ii. රමණි ඉෂිනි iii. රුවිනි සචිනි


31) සංඛ්‍යාවක බාගයෙන් කාලකට 8 ක් එකතු කළවිට පිළිතුර 18 නම් එම සංඛ්‍යාව වන්නේ,

i. 40 ii. 80 iii. 120

32) රුචිර ළඟ ඇති නෝට්ටු ප්‍රමාණය 4 කි. ඒවා සමාන නැත. ඔහු ළඟ ඇති නෝට්ටු වලින් වටිනාකම අඩුම නෝට්ටුව මෙන් 5 ගුණයකට සමාන වටිනාකමකින් යුත් නෝට්ටුවක් ද? එම නෝට්ටුව මෙන් පස්ගුණයක් වටිනාකම ඇති නෝට්ටුවක් ද එම නෝට්ටුව මෙන් දෙගුණයක් වටිනාකම ඇති නෝට්ටුවක් ද රුචිර ළඟ ඇත. රුචිර ළඟ ඇති නෝට්ටුවල වටිනාකම විය හැක්කේ,

i. රු. 810.00 කි ii. රු. 1200 කි iii. රු. 1620 කි

33) පහත දැක්වෙන්නේ සරඹ සන්දර්ශනයකදී ළමුන් සකස් වූ රටාවකි. මේ ආකාරයටම ඊළඟ හතරැස් ආකාරයට සකස් වීමට තව ළමුන් කීයක් අවශ්‍ය ද?



i. 9 ii. 25 iii. 30

34) සෙල්ලම් බෝනික්කන් සාදන කර්මාන්ත ශාලාවක A යන්ත්‍රයෙන් විනාඩි 8 කට බෝනික්කන් 32 ක් ද B යන්ත්‍රයෙන් විනාඩි 4 කට බෝනික්කන් 20 ක් ද C යන්ත්‍රයෙන් විනාඩි 10 කට බෝනිනක්කන් 40 ක්ද සාදයි.

පහත ප්‍රකාශන වලින් වැරදි ප්‍රකාශය තෝරන්න.

i. බෝනික්කන් සෑදීමේ වේගය A යන්ත්‍රයට වඩා B යන්ත්‍රයේ අඩුය.

ii. වැඩිම වේගයෙන් බොනික්කන් සාදන්නේ B යන්ත්‍රයයි

iii. A හා C යන්ත්‍රවල බෝනික්කන් සැදීමේ වේගය සමානය


35) පහත දී ඇති ද්‍රව්‍ය යුගලයේ පළමුවැන්න භාවිතා කිරීමට දෙවැන්න අත්‍යාවශ්‍යම නොවන යුගලය තෝරන්න.

i. ඉඳිකටුව නූල
ii. ලොරිය ඉන්ධන
iii. මේසය පුටුව

36) අඹ ගෙඩියක මිල මැංගුස් ගෙඩියක මිලට වඩා රුපියල් 8 ක් වැඩිය. අන්නාසි ගෙඩියක මිල අඹ ගෙඩි දෙකක මිලට සමානය. අන්නාසි ගෙඩියක් රු. 120.00 නම් මැංගුස් ගෙඩියක මිල වන්නේ,

i. රු. 60.00 ii. රු. 52.00 iii. රු. 68.00

37) දී ඇති රූපයේ ? ලකුණ ඇති තීරුවේ තිබිය යුතු සංකේත කාණ්ඩය කුමක් ද?



i. 
ii. 
iii. 

38) කවි ගායනා කිරීමේ තරඟයක් පවත්වා වැඩි ම කවි ප්‍රමාණයක් මතකයෙන් ගායනා කරන ශිෂ්‍යයා තේරීමට 5 ශ්‍රේණියේ ගුරුතුමිය තීරණය කළාය. එහිදී පළමු කවිය සඳහා තරු 1 ක්ද දෙවන කවිය සඳහා තරු 2 ක් ද තුන්වන කවිය සඳහා තරු 4 ක්ද යන ආකාරයට ගායනා කරන කවි ප්‍රමාණය අනුව තරු ලබා දීමට තීරණය විය. එම තරඟයෙන් නිපුන්ට ලැබී තිබුණ තරු ප්‍රමාණය 31 කි. නිපුන් ගායනා කළ කවි ප්‍රමාණය දැක්වෙන පිළිතුර වන්නේ,

i. 1 ii. 4 iii. 5

39) සමන්ගේ පියා ගුණපාලය. ගුණපාලගෙ පියා විජේසිරි ය. විජේසිරිට පිරිමි දරුවන් දෙදෙනෙක් හා ගැහැනු දරුවෙක් සිටි. සමන්ගේ බාප්පා පියසිරි ය. ඔහුට නීතා නමින් ගැහැනු දරුවෙක් සිටී. නීතා හා විජේසිරි අතර ඥාති සම්බන්ධය දැක්වෙන පිළිතුර තෝරන්න

i. දුව තාත්තා
ii. මිනිබිරිය සීයා
iii. දුව තාත්තා

40) උදේ නිවසේ සිට පාසලට යන සුපුන්ගේ සෙවණැල්ල ඔහුගේ පිටුපසට වැටී ඇත. ටික දුරක් ඉදිරියට ගිය සුපුන් වම් පැත්තට හැරී මීටර් 100 ක් ගමන් කර දකුණු පැත්තට හැරී පාසල වෙත ගමන් කරයි. ඔහු ගමන් කළ දිශා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. නැගෙනහිර උතුර බටහිර
ii. නැගෙනහිර උතුර නැගෙනහිර
iii. නැගෙනහිර දකුණ නැගෙනහිර

ප්‍රති ප්‍රබෝධා - 2024

5 ශ්‍රේණිය

5 ශ්‍රේණියේ සියලු දරුවන් සඳහා පැවැත්වෙන
පෙරහුරු පරීක්ෂණය

(II පත්‍රය) **කාලය පැය 1 යි 45 යි**

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය :-.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉර මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරු යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේතය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි	**V/II/S**
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි	**V/II/S**
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි	**V/II/S/EMF**
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	**V/II/S/CH**

-උතුරු මැද පළාත් ප්‍රාථමික අංශය -

❖ **පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.**

ඉතා ඈතින් නමුත් පියවි ඇසෙන් පෙනෙන තෙක් මානයේ කඳු වැටි පේළියක් පෙනිණි. නිල්වන් මුහුදු ජලයේ වර්ණය ක්‍රමයෙන් සිදි වඩ වඩාත් හරිත වර්ණයටත් අඳුරු පැහැයටත් මාරු වෙමින් පැවතිණි. සුර්යයා පවා හොඳින් බැබළෙමින් නොතිබිණි. මෙතෙක් සුර්යයා කෙරෙහි මා තුළ පැවති සිතුවිලි ඈත පෙනෙන දිවයින කරා යොමු විය. සිරගතව සිටින පාවෙන මාලිගාවෙන් මිදුණු පසු අපේක්ෂිත නිදහස රස විඳින්නත් අපි සිහින මැව්වෙමු. (සිංහල කියවීම් පොත - 5 ශ්‍රේණිය)

❖ **අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදය ඇසුරින් තෝරා ලියන්න.**

1) i. පියවි ඇසට පෙනෙන තෙක් මානයේ පිහිටා ඇත්තේ කුමක් ද?

.....

ii. ක්‍රමයෙන් වර්ණය වෙනස් වෙමින් පවතින්නේ කුමන දෙයක ද?

.....

iii. "මෑතින්" යන පදයේ විරුද්ධාර්ථ පදය ලියන්න.

.....

iv. " හතරවටින් ම ජලයෙන් වට වූ ගොඩබිම" යන අදහස දෙන තනි පදය ඡේදයේ ඇත. එය කුමක් ද?

.....

v. " බලාපොරොත්තු" යන වචනයේ තේරුම දෙන තවත් පදයක් ඡේදයේ ඇත. එම වචනය ලියන්න.

.....

vi. බහු වචන අතීත කාල ක්‍රියා පදය තෝරා ලියන්න.

.....

2) පහත සඳහන් පදවලින් අක්ෂර වින්‍යාසය **නිවැරදි** පද තෝරා යටින් ඉරක් අඳින්න.

i. සියලු දෙනා / සියළු දෙනා

ii. හත්පන / හත්පණ

iii. විද්‍යාඥයා / විද්‍යාඤයා

3) කොටුව තුළ ඇති වචන පමණක් භාවිතකර **අර්ථවත් වාක්‍ය** දෙකක් ලියන්න.
(එක් වචනයක් එක් වතාවකට වඩා භාවිත කළ නොහැකි අතර එක් වාක්‍යයකට වචන 5 හෝ ඊට වැඩි විය යුතුය.)

යහපත්	මම	රටට	නිරත
සතුටින්	ගුණැති	එම	ආඩම්බරයෙකි
කාර්යයෙහි	දරුවෝ	මහත්	වුවෙමි

i. .....

.....

ii. .....

.....

4) පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (√) ලකුණ ද

වැරදිනම් (X) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

i. විදුහල්පතිතුමිය හරවත් කතාවක් කළා ය. ( )

ii. ඔවුහු ගීත රස වින්දේ ය. ( )

iii. අපි ළමා නාට්‍යයක් නරඹමු ( )

iv. ගස්වල මල් පිපී සුළඟට සෙලවෙයි. ( )

5) සුදුසු විරාම ලකුණු යොදන්න

මැදගිල්ල තම යි ලොක්කා නංගී උත්තර දුන්නා ය

6) පහත සඳහන් එක් එක් ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ඉදිකටුවයි ..... වගේ

ii. කට නිසා ඉබ්බා ..... වගේ

7) පහත දී ඇති වගන්තිවල හිස් තැන්වලට ගැළපෙන නිවැරදි යුගළපද කොටුව තුළින් තෝරා ලියන්න.

i. නිතර ..... යෑම වියදම් අධික වීමට හේතුවකි.

ii. තාත්තා හවසට රසවත් ..... ගෙන එයි.

යාන වාහන, ගමන් බිමන්, කෑම බීම, තෑගි බෝග

8) පහත සඳහන් අවස්ථාවලට ගැළපෙන ඉඟිවැකි තිත් ඉරි මත ලියන්න.

i. රවටනු පිණිස වර්ණනා කිරීම.

.....

ii. දැඩි සතුටකට පත්වුණා.

.....

9) මෙම වාක්‍යය අතීත කාල බහුවචනයට හරවා නැවත ලියන්න.

i. ක්‍රීඩිකාව පුහුණුවීම් කටයුතු කළා ය.

.....

10) කොටුව තුළ දී ඇති වචනවලින් " රකාරාංශය" යෙදුණු වචනය තිත් ඉරි මත ලියන්න.

ශිෂ්‍යයා , ග්‍රහණය , අධ්‍යාපනය

.....

11) " නැත" යන අර්ථය හැඟවෙන ලෙස පහත දී ඇති වචනය තනි වචනයෙන් ලියන්න.

හඬ : .....

12) පහත සඳහන් කවියේ දෙවන පද පේළිය සම්පූර්ණ කරන්න.

ඒ මල් වැස්සේ තෙම් තෙම්

.....

බණ්ඩි ඇදී කිරට නැමී

කරල් බිමට නැමෙනවාය

13) පින්තූර දෙස බලා ඒවාට ගැළපෙන වචනය ඉංග්‍රිසි අකුරෙන් ලියන්න.





i. ..... ii. .....

iii. මෙම වැකියේ අර්ථය ඉංග්‍රිසියට හරවා ඉංග්‍රිසි අකුරෙන් ලියන්න.

කවුද කෑ ගහන්නේ ? .....

iv. අර්ථය සිංහලෙන් ලියන්න.

How old are you ? .....

v. I am Ruwan .....

14) i. පහත සඳහන් වගන්තිය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

වතුර දෙන්න. .....

ii. පහත සඳහන් දෙමළ වැකියේ අර්ථය සිංහලෙන් ලියන්න.

වෙළියේ පෝහලාමා ? .....

15)" තාත්තා හැමදා ම කියන්නේ මොන වැඩ තිබුණත් අඩු ගණනේ මාසයකට සැරයක්වත් ගමේ "ගිහින් එන්න ඕනෑ ය" කියලා ....."අපේ ගෙදර සියලු දෙනා ම පසුගිය සතියේ අත්තම්මලා ගේ ගමට ගියා. "අපි ගමේ ගොස් කළ කී දේ" පිළිබඳව අර්ථවත් වාක්‍ය 3 ක් ලියන්න. (සෑම වාක්‍යකම වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුය. උක්ත අඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය.)

i. .....

.....

ii. .....

.....

iii. .....

.....

❖ ප්‍රශ්න අංක 16 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියන්න.


16) අකුරෙන් දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

අසූපන්දහස් අනූ නවය :- .....

17) දී ඇති සංඛ්‍යාව නිවැරදිව විභිදුවා ලියන්න.

43062 : ..... + ...+ ..... + ...+ .....

18)පහත සඳහන් පතරොම් ඇසුරෙන් ඝනකයක් සාදාගැනීමට භාවිතා කරගත හැකි පතරොම කුමක් ද? නිවැරදි පිළිතුරට අදාළ අක්ෂරය හිස් තැන මත ලියන්න.



(1) (2) (3)

(.....)

19)තාත්තා පෙ.ව. 6.45 ට නිවසින් පිටත් වී පෙ.ව. 8.15 ට කාර්යාලයට ගියේ ය. තාත්තාට කාර්යාලයට යාමට ගත වූ කාලය කොපමණ ද?

පැය ..... මිනිත්තු .....


20)මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යාව ලියන්න.

2, 6, 18, 54, ...

21)පහත දී ඇති සංඛ්‍යා පිළිවෙළ අනුව සංඛ්‍යා රටාවක් ලබාගැනීමට ඉවත් කළ යුතු සංඛ්‍යාව කුමක් ද?

2 ,4 ,12, 36, 48 , ...

22) මෙම රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.....

23) අභ්‍යාස පොත් 48 කින් $\frac{3}{4}$ ක් පොත් කීය ද?

පොත් : .....


24) රු. 22.50 බැගින් රිබන් මීටර 2 ක් ද රු.20.00 බැගින් පාට පැන්සල් 3 ක් ද මිලට ගෙන රු.50.00 ක නෝට්ටු තුනක් වෙළෙන්දාට දුන්විට ලැබෙන ඉතිරි මුදල කීය ද?

රු..... සත .....

25) සුදු රෙදි 10m ක ප්‍රමාණයකින් 2m 50cm බැගින් වූ කැබලි 3 ක් කපා ඉවත්කළ විට ඉතිරි රෙදි කැබැල්ලේ දිග කොපමණ ද?

.....m ..... Cm

26)




අන්නාසි ගෙඩියේ බර ..... kg ..... g කි.

27) වීදුරු බෝල 624 ක් සමාන ලෙස පෙට්ටි 6 කට වෙන් කළේ නම් එක පෙට්ටියක ඇති වීදුරු බෝල ගණන කීයද ?

: .....

28) යසස පන්තියේ සිසුන් වඩාත් කැමති මල් වර්ග පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.



i. ප්‍රස්තාරයට අනුව කුමුදු මල්වලට වඩා මානෙල් මල්වලට කැමති මුළු පිරිස කොපමණ ද?

.....

ii. කණ්ඩායමේ සිටින මුළු සිසුන් ගණන කීයද ?

.....

29) කොටුව තුළ ඇති සංඛ්‍යාවලින් දෙකක් එකතු වූ විට 671 ලැබේ. එම සංඛ්‍යා දෙක තෝරා ලියන්න

120, 292, 379, 541

....., ...

30) 

දහම්සා ළඟ ඇති මුළු බැලුන් ප්‍රමාණය රෝම සංඛ්‍යාවකින් ලියන්න.

.....

❖ අංක 31 සිට 60 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31) පත්‍ර තලය මත කටු දැකිය හැකි ශාකයකි

i. අන්නාසි ii. නිදිකුම්බා iii. එළබටු

32)මල් හට නොගන්නා ශාකයකි.

i. මීවන ii. ගිරිතිල්ල iii. පුවක්

33)සරුවට වැඩුණු තණකොළ සහිත බිමක් පොල් කටුවකින් වසා තබා ටික දිනකින් විවෘත කර බැලූවිට තණකොළ කහ පැහැති වී තිබුණි. එයට හේතුව වන්නේ තණකොළ වලට

i. හිරු එළිය නොලැබීමයි ii. ජලය නොලැබීමයි iii. සරු පසක් නොලැබීමයි

34)එදිනෙදා ජීවිතයට අවශ්‍ය කරන දැව භාණ්ඩ සාදන කර්මාන්තය කුමක් ද?

i. පෙදරේරු කර්මාන්තය ii. වඩු කර්මාන්තය iii. කම්මල් කර්මාන්තය

35)බීජ තවාන් කිරීමෙන් පැළ ලබාගන්නා ශාකවර්ගයකි.

i. වට්ටක්කා ii තක්කාලි iii. බෝංචි

36)රෝග වාහකයා වන මදුරුවෙකු මගින් බෝවන රෝගය කුමක් ද?

i. මැලේරියා ii. මහාමාරිය iii. ජලභීතිකාව

37)“ හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මව් බිම ඉපදී ඉන්නේ”
මෙම ගීතය ගායනා කරන ගායිකාව වන්නේ,

i. නන්දා මාලනි මහත්මියයි ii. ලතා වල්පොළ මහත්මියයි

iii. ඉන්ද්‍රාණි විජේබණ්ඩාර මහත්මියයි

38)සමනලයාට ඇති පාද ගණන කීයක් ද?

i 4 කි ii. 6 කි iii. 8 කි

39)අන් අයට පීඩාකාරීවන ක්‍රියාකාරකමක් නොවන්නේ මින් කුමක් ද?

i. මහා හඬින් දුරකතන ඇමතුමක් හා සම්බන්ධ වීම

ii. මහා මර්ගයේ ක්‍රීඩා කිරීම iii. පිරිසිදුව පිරිස අතර හැසිරීම

40)ප්‍රමාණවත් තරම් ජලය පානය නොකිරීම නිසා සිදුවන අයහපත් ප්‍රතිඵලයකි.

i. මුත්‍රා කිරීමේ අපහසුව ii. වකුගඩු නිරෝගි වීම

iii. රෝගාබාධ අඩු වීම

41)සුළඟ මගින් හා සතුන් මගින් ව්‍යාප්තවන බීජ වර්ග පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. පොල්, හොර ii. හොර, නාගදරණ iii. නාගදරණ, වරා

42)බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක මොනවාද ?


i. කොළඹ, ගම්පහ, කළුතර ii. කොළඹ, ගම්පහ, පුත්තලම

iii. කොළඹ, ගාල්ල, මාතර

43) විද්‍යුත් චුම්භකයක් සහිත උපකරණයක් වන්නේ,

i. විල්බැරෝව ii. විදුලි සීනුව iii. විදුලි ස්ත්‍රික්කය


44)



වියළි කෝෂයක් යොදාගෙන විදුලි බුබුළු දෙක ම එකවර දැල්වීමට අවශ්‍ය අවම වයර් කැබලි ගණන කීයද?


i. 2 කි ii. 3 කි iii. 4 කි

45) රාත්‍රී අහස නිරීක්ෂණයේ දී තරු රටා රාශියක් පියවි ඇසෙන් දැකිය හැක. ඒ අතරින් ගෝනුස්සා තරු රටාව කුමක් ද?



(i) (ii) (iii)

46) වතුර වීදුරුවකට පොල් තෙල් ස්වල්පයක් දමා ටික වේලාවකට පසුව දැකිය හැකි ආකාරය වන්නේ,



(i) (ii) (iii)

47) වැඩ පහසු කරවන යන්ත්‍රය සහ එය ක්‍රියා කරවන ආකාරය නිවැරදිව දක්වන පිළිතුර වන්නේ,

i. බොලොක්කය ⟶ තල්ලු කිරීම
ii. විල්බැරෝව ⟶ තල්ලු කිරීම
iii. ගිරය ⟶ ඇදීම

48) ප්‍රථමාධාර පෙට්ටියක් තුළ නොතිබිය යුතු දෙයකි.

i. ලී පතුරු කිහිපයක් ii. වෙලුම් පටි කිහිපයක් iii. කල් ඉකුත් නොවූ ඖෂධ කිහිපයක්

49) සෑම රජයේ පාසලකම සෑම සිසුවෙකුටම නොමිලේ ලබාදෙන දෙයක් නොවේ,

i. පාසල් නිල ඇඳුම් රෙදි ii. පෙළ පොත් iii. උදේ ආහාරය

50) දවස පුරාම අපට සේවා ලබාදෙන ආයතනයකි.

i. පාසල ii. රෝහල iii. බැංකුව

51) වැලි යට දමා කල් තබා ගන්නා ආහාරයකි.

1. දෙල් ii. දෙහි iii. බිලිං


52) 1910 දී ගුරුවරයෙකු ලෙස කටයුතු කළ ටී.බී. ජයා මහතා වන්නේ,



i



ii



iii

53) ඇස හා කන යන දෙකෙන් ම තොරතුරු ලබා ගන්නා මාධ්‍යයකි

i. ගුවන් විදුලිය ii. රූපවාහිනිය iii. පුවත් පත

54) ගොදුරු සොයා ගැනීම සඳහා තම රැවුල් කෙඳි භාවිතා කිරීමේ සුවිශේෂී හැකියාව ඇති සතා වන්නේ,

i. බළලා ii. බල්ලා iii. එළුවා

55) ග්‍රාම නිලධාරි කාර්යාලය මගින් සපයන සේවයේ සේවා ලාභියා කවුරුන් ද?

i. ප්‍රාදේශීය ලේකම්තුමා
ii. ග්‍රාම නිලධාරිතුමා
iii. ගම්වැසියා

56) ගෙවත්තේ බෝග වගාවක් සඳහා හිතකර සතුන් පමණක් ඇතුළත් කර ඇති පිළිතුර වන්නේ

i. ගැඩවිලා, මී මැස්සා, කුරුමිණියා
ii. සමනලයා, මී මැස්සා, කීඩෑවා
iii. බකමුණා, මී මැස්සා, ගැඩවිලා

57) ශ්‍රී ලංකාවේ මාර්ග සඳහන් සිතියමක දුම්රිය මාර්ග සලකුණු කිරීමේ දී භාවිතා කරන සම්මත වර්ණය කුමක් ද?

i. කළු වර්ණයයි ii. රතු වර්ණයයි iii. නිල් වර්ණයයි

58) අපේ රටේ ස්වාභාවික වරායක් පිහිටා ඇත්තේ කුමන නගරයකට ආසන්නයේ ද?

i. ගාල්ල ii. හම්බන්තොට iii. ත්‍රිකුණාමලය

59) ශාකවල පැවැත්මට සුළඟේ ශක්තිය ප්‍රයෝජයට ගන්නා අවස්ථාවකි.

i. පරාගනයට හා බීජ ව්‍යාප්තියට
ii. ශාකවල ආහාර නිෂ්පාදනයට
iii. ශාකවල මල් හට ගැනීමට

60) ප්‍රෝටීන් බහුලව අඩංගු ශාකමය ආහාරයකි.

i. වට්ටක්කා ii. දඹල iii. ගොටුකොළ